ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල - 2024

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ (භාර අරමුදල) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභාලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන තුළින් භාර අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, භාර අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය භාර අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා භාර අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

භාර අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, භාර අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් භාර අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ භාර අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ භාර අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, භාර අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ඉකුත් වර්ෂයේ වෙනත් වත්කම් යටතේ දක්වා තිබූ ස්ථාවර තැන්පතු සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය වත්කම් යටතේ දක්වා තිබූ අතර වර්ගීකරණයේ සිදු කළ මෙම වෙනස්කමට අදාලව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 හි 41 ඡේදය ප්‍රකාරව සංසන්දනාත්මක අගයන් යළි වර්ගීකරණය කර නොතිබුණි.	ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව වත්කම්වල වර්ගීකරණයේ සිදුකළ වෙනස්කම්වලට අදාළව පසුගිය වර්ෂයේ සංසන්දනාත්මක අගයන් ද යළි වර්ගීකරණය කළ යුතුය.
(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි51 වන ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ඵලදායී ජීවිත කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළයුතු අතර වෙනස්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතු වුවද	අරමුදලේ විධායක තනතුරු සියල්ල මේ වන විට පුරප්පාඩුව පවතින අතර සීමිත කාර්යමණ්ඩලයක් තුළින් රාජකාරි ඉටු කරවා ගැනීමට සිදුව ඇත.මේ සම්බන්ධයෙන් ඉදිරියේදී වාර්තා කරනු ලැබේ.	සම්පූර්ණයෙන් ක්ෂයකර අවසන් එහෙත් තවමත් භාවිතා කරන වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව වාර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර අවශ්‍ය හෙළිදරව් කිරීම් කළ යුතුය. තාවකාලිකව නිෂ්ක්‍රීය වත්කම් සම්බන්ධයෙන් ද අදාළ හෙළිදරව් කිරීම් සිදු කළ යුතුය.

	සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් එහෙත් තවමත් භාවිතා කරන සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පිරිවැය රු.16,473,018 ක් වූ දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. ප්‍රමිතියේ 79 (ආ) ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශනවල උක්ත වත්කම් සම්බන්ධයෙන් අදාළ හෙළිදරව් කිරීම් සිදු කරද නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති තාවකාලිකව නිෂ්ක්‍රීය රු.10,748,100 ක් වටිනා දේපල, පිරියත හා උපකරණ තොගය සම්බන්ධයෙන් ප්‍රමිතියේ 79 (අ) හා (ඇ) ඡේද අනුව හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.		
(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40 හි 16 ඡේදයට පටහැනිව 99 අවුරුදු බදු පදනම යටතේ ලබා ගැනීමට එකඟව නාගරික සංවර්ධන අධිකාරියෙන් භෞතික භුක්තිය පමණක් පැවරීමේ පදනම මත රු. 340,200,000 ක අත්තිකාරමක් ගෙවා තිබූ, අත්පත්කර ගැනීමේ කටයුතු සම්පූර්ණ වී නොතිබූ මිල්ලෑවවත්ත නම් ඉඩම සහ ආදායම් ඉපයීම සඳහා ගිවිසුම් වලට එළඹ නොමැති මාලඹේ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) පවත්වාගෙන යන වටිනාකම රු. 1,064,520,695 ක් වූ ගොඩනැගිලි, ආයෝජන දේපල ලෙස ගිණුම්ගත කර තිබුණි.	මේ සම්බන්ධයෙන් වෝහාරික විගණනයක් සිදු කිරීමට භාරකාර මණ්ඩලය තීරණය කර ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 හි 32 හා 33 ඡේද අනුව ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර සඳහා වූ රජයේ දායක මුදල ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා ලද රු.1,286,146,850 ක ආදායම මහපොළ ශිෂ්‍යාධාර වියදම් සමඟ හිලවු කර තිබුණි. මීට අදාලව ඍජු	උපචිත පදනම මත ගිණුම්ගත කර ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමේ දායකය සටහන් කර ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ආදායම් හා වියදම් නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය.

වියදම් යටතේ වූ සටහන තුළ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර ගෙවීම් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමෙන් ලද මුදල තුළ ශිෂ්‍යාධාර (මහපොළ ශිෂ්‍යාධාර නොවන) රු.213,628,000 ක් ද ඇතුළත් කර තිබීම හේතුවෙන් සටහනේ දැක්වුණු වර්ෂයේ මහපොළ ශිෂ්‍යාධාර ආදායම හා වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.		

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) මුල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට භාණ්ඩාගාර බිල්පත් මත ලැබිය යුතු පොළී ආදායම රු 170,440,105 ක් වුවද විගණනයේ ගණනය කිරිම් අනුව එම වටිනාකම රු.275,993,745 ක් වූයෙන් පොළී ආදායම හා වත්කම් රු.105,553,640 ක් අඩුවෙන් දැක්වුණි.	නිවැරදි කර ඇත.	ලැබිය යුතු පොළී ආදායම නිවැරදිව ගණනය කර ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය.
(ආ) ගෙවීම් වවුචර් අනුව 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍යත්වලාභීන් තේරීමේ කටයුතු වෙනුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ගෙවිය යුතු මුදල රු.960,515 ක් වුවද මුල්‍ය ප්‍රකාශනවල එය රු. 2,332,731 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වගකීම් හා වියදම් රු.1,372,216 කින් වැඩියෙන් දැක්වුණි.	මෙය 2020/21, 2021/22 හා 2022/23 වර්ෂ සඳහා ගෙවිය යුතු මුදල් වේ.	වර්ෂයට අදාළ වියදම් හා වගකීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය.
(ඇ) ගෙවිය යුතු මහපොළ ශිෂ්‍යාධාර ගිණුමේ ආරම්භක ශේෂය රු.8,042,000ක් වැඩියෙන් සටහන්කර තිබීම නිවැරදි කිරීමේදි, රඳවාගත් ඉපයීම් ගිණුම බැර කිරීම වෙනුවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබිය යුතු ගිණුම බැර කර තිබුණි.	මෙම නිවැරදි කිරීම සිදු කර ඇත්තේ ශිෂ්‍යත්ව ගෙවීම් ගිණුමේ හා ලැබිය යුතු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම යන ගිණුම් දෙක අතරය.	වැරදි නිවැරදි කිරීමේදි අදාල ගිණුම නිවැරදිව හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය.

1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශන අනුව භාණ්ඩාගාර බැඳුම්කර මත වටිනාකම රු.377,273,000 ක් වුවද ඊට අනුරූපීව ඉදිරිපත් කරන ලද වාර්තා අනුව එම වටිනාකම රු.200,273,000 ක් වීමෙන් රු.177,000,000 ක වෙනසක් නිරීක්ෂණය විය.	මූල්‍ය ප්‍රකාශන අනුව ඇති අගයන් සඳහා Deal Note නොමැත. මුහුණත අගය සඳහා වන Deal Note මේ වන විටත් විගණනයට ඉදිරිපත් කර ඇත.	මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වටිනාකම් අදාල උපලේඛණ සමග සැසඳීම කළ යුතුය.

1.5.4 ඒකාබද්ධ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
භාර අරමුදලේ පූර්ණ අයිතිය සහිත පරිපාලිත සමාගම වන නැෂනල් වෙල්ත් කෝපරේෂන් හා උප පරිපාලිත සමාගම වන නැට්වෙල්ත් සෙකියුරිටීස් යන සමාගම් සමඟ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 26 අනුව පිළියෙළ කළ යුතු ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලපරිච්ඡේදය සඳහා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	නැට්වෙල්ත් සෙකියුරිටීස් හා නැෂනල් වෙල්ත් කෝපරේෂන් යන සමාගම් සඳහා මූල්‍ය ප්‍රකාශන නිසි පරිදී සකස් කර ඉදිරිපත් කරන ලෙස එහි අධ්‍යක්ෂක වෙත දැනුම් දී ඇත. ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	අරමුදලේ පරිපාලිත සමාගම් සමඟ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළ යුතුය.

1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂය	මුදල (රු)	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතයේ බදුකුලී ආදායම	25,000,000	බදු ගිවිසුමේ මුල් පිටපත හා බදු කුලී ගණනය කිරීමට අදාළ තක්සේරු වාර්තා	ඡායා පිටපතක් පමණක් කාර්යාලයේ ඇත.	බදු ගිවිසුමේ මුල් පිටපත විගණනයට ඉදිරිපත් කළ යුතුය.
(ආ)	නැට්වෙල්ත් සෙකියුරිටීස් සමාගමේ බැංකු ගිණුමට මාරු කිරීම	7,200,000	භාරකාර මණ්ඩල අනුමැතිය හා අදාල මුදල් සමාගමට ලද බවට තහවුරු ලිපි	මේ සම්බන්ධයෙන් ‍වෝහාරික විගණනයක් සිදු කිරීමට භාරකාර මණ්ඩලය තීරණය කර ඇත.	භාරකාර මණ්ඩල අනුමැතිය හා අදාල මුදල් සමාගමට ලද බවට තහවුරු ලිපි විගණනයට ඉදිරිපත් කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) මූල්‍ය ප්‍රකාශන අනුව මහපොළ වෙළෙඳ ප්‍රදර්ශන සඳහා ලැබිය යුතු රු 40,791,005 ක් සහ වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.1,021,450 ක් වූ ශේෂ සම්බන්ධයෙන් ශේෂ තහවුරු කිරීමේ ලේඛන විගණනයට ඉදිරිපත් නොවූ අතර මෙම වටිනාකම් ගෙවිය යුතු ශේෂ ලෙස අදාළ ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	මේ සම්බන්ධයෙන් ව්‍යෝහාරික විගණනයක් සිදු කිරීමට භාරකාර මණ්ඩලය තීරණය කර ඇත.	ලැබිය යුතු ශේෂ තහවුරු කරගෙන අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීම කළ යුතුය.
(ආ) අරමුදලේ කාර්යාලය කලින් පවත්වාගෙන ගිය ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය වෙත තැන්පත් කළ රු.1,811,700 ක කුලී තැන්පතුව එම ස්ථානයෙන් ඉවත් වී වර්ෂ 06 කට අධික කාලයක් ගතව තිබුණ ද නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023 මැයි 01 දින තෙක් ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානයේ මහපොළ කාර්යාලයේ පවත්වාගෙන ගිය අතර ඉන් පසු අවස්ථා ගණනාවකදී තැන්පතු මුදල වූ රු.1,811,700 ක මුදල ඉල්ලා යවා ඇත.	අයවිය යුතු තැන්පතු මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) පාසල් කිහිපයක සිදු කරනු ලැබූ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් පාසැල් සංවර්ධන සමිතිවලට අරමුදලින් ගෙවිය යුතු වියදම් එකතුව රු.3,832,875 ක් 2013 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද අදාල ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	භාරකාර මණ්ඩල අනුමැතිය පරිදි ආදායම් ලෙස ගිණුම් ගත කර ඇත.	අදාළ පාර්ශවයන් හඳුනාගෙන ගෙවීම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

(ආ)	විශ්වවිද්‍යාල සිසුන්ට ශිෂ්‍යත්ව ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකු වෙත යවා තිබූ වාරික මුදල්වලින් සිසුන්ගේ නම, ගිණුම් අංකය ආදී තොරතුරු තහවුරුනොවීම හේතුවෙන් බැංකු විසින් ආපසු හරවා එවා තිබීමෙන් ගෙවිය යුතු වියදමක් ලෙස දක්වා තිබූ රු.3,851,703ක් නිරවුල්කර අදාල සිසුන්ට නැවත ගෙවීමට කටයුතු කර නොතිබුණි.	තවදුරටත් ගෙවිය හැකි ආපසු හරවා එවන ලද මුදල් ඉදිරි මාස දෙක ඇතුළත ගෙවා නිම කිරීමට කටයුතු කරනු ලැබේ. මේ වන විට විශ්වවිද්‍යාල හැරගොස් හා අධ්‍යයන කටයුතු අවසන් වූ සිසුන්ගේ හා නිවැරදි බැංකු ගිණුම් විස්තර එවා නොමැති සිසුන්ගේ ගෙවීම් තව දුරටත් ඉතිරි වී ඇති බැවින් ඒවා ඉවත් කිරීමට එම අගයන් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී.	ශිෂ්‍යත්ව ගෙවිය යුතු සිසුන්ට අදාල මුදල් ගෙවා ගෙවියයුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 2(1) සහ 102 වගන්ති	භාර අරමුදල විසින් ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට හෝ බදු නිදහස් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ආදායම් බදු සඳහා ලියාපදිංචි වී ඇත. 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනතේ 12 වගන්තිය අනුව ආදායම් බදුවලින් නිදහස් වේ.	පනතේ විධිවිධාන අනුව ආදායම් බදුවලින් නිදහස් වන බවට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් සනාථ කරගත යුතුය.
(ආ)	2019 ජනවාරි 29 දිනැති අංක 2/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 05 වන වගන්තිය	(i)මහපොළ උසස් අධ්‍යාපන මාසික ශිෂ්‍යත්ව වාරිකය අදාල මාසයේ 15වන දින වන විට ශිෂ්‍යත්වලාභීන්ගේ බැංකු ගිණුම් වෙත බැරකළ යුතු වුවද202 4 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාසික ශිෂ්‍යත්ව වාරික ගෙවීමේදී අවස්ථා 31 කදී දින 45 - 190 අතර කාල ප්‍රමාදයක් පැවතුණි.	විශ්වවිද්‍යාල වලින් ඉල්ලීම් සිදු කිරීම ප්‍රමාද වීම හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් භාණ්ඩාගාර දායකත්වය ලබා දීමේදී සිදු වන ප්‍රමාදයන් හේතුවෙන් ප්‍රමාදයන් සිදු වේ. එබැවින් භාරකාර මණ්ඩල උපදෙස් මත භාණ්ඩාගාර දායකත්වය වෙළෙඳ අමාත්‍යංශයේ වැය ශීර්ෂයක් යටතේ ලබා දෙන ලෙස ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීම් කර ඇත.	මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව වාරික නියමිත කාලය තුළ ගෙවීම් කිරීමට විධිමත් ක්‍රමවේදයක් කඩිනමින් සකස් කළ යුතුය.
		(ii)මාසික ශිෂ්‍යත්ව ගෙවීම් ලේඛන ඉකුත් මාසයේ 30 වන දින වන විට භාර අරමුදල විසින් උසස්	උසස් අධ්‍යාපන ආයතනවලින් ඉල්ලීම් කිරීමේදී ප්‍රමාද වීම් සිදු වේ.	නියමිත දිනට අවශ්‍ය ලේඛන ගෙන්වා ගැනීමට විධිමත්

අධ්‍යාපන ආයතන වෙත යොමු කළ යුතුවේ. 2024 වර්ෂයේ මොරටුව සහ කැළණිය විශ්වවිද්‍යාලවලට අදාලව සිදු කරන ලද නියැදි පරීක්ෂාවකදී එම විශ්වවිද්‍යාල වෙත, අරමුදල විසින් ගෙවීම් ලේඛන යොමු කිරීමේදී පිළිවෙලින් දින 59 - 118 අතර සහ දින 40 – 95 අතර කාල ප්‍රමාදයන් පැවතුණි.		ක්‍රමවේදයක් සකස් කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 2,261,478,730 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,752,507,174 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,491,028,444 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායම රු. 747,478,422 කින් හා වෙනත් අනෙකුත් විස්තීරණ ආදායම රු.703,202,233 කින් අඩුවීමත්, ශිෂ්‍යත්ව ගෙවීම් රු.45,023,863 කින් වැඩිවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අනාර්ථික ගනුදෙනු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2023 දෙසැම්බර් 13 සිට 17 දක්වා ජාඇල නගර සභා ක්‍රීඩාංගනයේ පවත්වා තිබූ මහපොළ වෙළඳ ප්‍රදර්ශනය වෙනුවෙන් ඉකුත් වර්ෂයේ රු.126,874,496 ක් හා සමාලෝචිත වර්ෂයේ රු.618,373ක් වැයකර තිබූ අතර අරමුදලේ ආදායම රු.2,343,035,448 ක් වීමෙන් ප්‍රදර්ශනය තුලින් රු.29,665,257 ක් අලාභ ලබා තිබුණි. තවද 2024 මැයි මස අනුරාධපුරයේ පැවැත්වීමට සැලසුම් කළ වෙළඳ ප්‍රදර්ශනය වෙනුවෙන් රු.8,552,128 ක වියදම් දරා තිබුණද වෙළඳ ප්‍රදර්ශනය පවත්වා නොතිබුණි.	මේ සම්බන්ධයෙන් වෝහාරික විගණනයක් සිදු කිරීමට භාරකාර මණ්ඩලය තීරණය කර ඇත.එසේම භාරකාර මණ්ඩල අනුමැතිය මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර ඇත.	ජා - ඇල ප්‍රදර්ශනය අලාභ ලැබීම සහ අනුරාධපුර ප්‍රදර්ශනය නොපැවැත්වීම සම්බන්ධයෙන් පරීක්ෂාකර අකාර්යක්ෂමතා පවතී නම් වගකිව යුතු පාර්ශව වෙතින් අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	නිර්දේශය
භාර අරමුදලේ අරමුණක් වූ යෞවනයන්ගේ වෘත්තීය නිපුණතා වැඩිදියුණු කර ගැනීමට වෘත්තීය අභ්‍යාස ආයතන පිහිටුවීම වෙනුවෙන් මාළඹේ පිහිටි ඉඩමක් කඩුවෙල ප්‍රාදේශීය ලේකම්ගෙන් වර්ෂ 2000 දී පවරාගෙන තිබූ අතර ඉඩම පැවරීමේ ලිපියේ කොන්දේසි අනුව ඉඩම අත්කරගත් කාර්යය හැර වෙනත් කාර්යයක් සඳහා නොයෙදවිය යුතු විය. එසේ වුවද ඉඩම පවරාගත් අරමුණට පටහැණිව 2015 වර්ෂයේ සිට එකී ඉඩම ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) වෙත බදු පදනම මත ලබා දී තිබුණි.	මේ පිළිබඳව COPE කමිටුව ඉදිරියේ කරුණු දක්වා ඇති අතර ඉදිරියේදී අමාත්‍ය මණ්ඩලය සුදුසු තීරණයක් ගනු ඇත.	මීට වගකිව යුතු පාර්ශවවලට එරෙහිව නීතිමට ක්‍රියාමාර්ග ගත යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	නිර්දේශය
(අ) 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනතේ 5 වන වගන්තිය අනුව භාර අරමුදලේ ප්‍රධාන අරමුණු 5 අතරින් ආධාර ලැබීමට සුදුසු යෞවනයන්ට උසස් අධ්‍යාපනය සඳහා ආධාර සැලසීම යන අරමුණ පමණක් ඉටුකිරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව 2022/2023 අධ්‍යයන වර්ෂයට අදාලව විශ්වවිද්‍යාලයකට බඳවා ගන්නා හා ශිෂ්‍යත්වයක් ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන් 42,147 සඳහා මහපොළ ශිෂ්‍යත්වය පිරිනැමීම ඉලක්ක කර තිබුණ ද, දෙමාපියන් විසින් උපයනු ලබන වාර්ෂික ආදායම රු.500,000 කට අඩුවිය යුතුවීම නිර්ණායකයක් ලෙස පදනම් කර ගැනීම හේතුවෙන් 2022/2023 අධ්‍යයන වර්ෂයට අදාලව මහපොළ ශිෂ්‍යත්ව ලැබීමට සුදුසුකම් ලද සිසුන් 23,560 ක් වූ අතර ඔවුන් අතරින් සිසුන් 17,000 කට පමණක් ශිෂ්‍යත්ව පිරිනමා තිබුණි.	පවතින අරමුදල් කළමනාකරණය කර ගනිමින් ශිෂ්‍යත්ව ගෙවීම් සිදු කරනු ලබන අතර 2025 අප්‍රේල් මස සිට ශිෂ්‍යත්ව වාරිකය රු.7,500 දක්වා ඉහළ නංවා ඇත. එසේම උසස් තාක්ෂණ ආයතනය හා අනෙකුත් ආයතන සිසුන් සඳහා පිරිනමනු ලබන ශිෂ්‍යත්ව වාරිකයද සමානුපාතිකව ඉහළ නංවා ඇත.	ආධාර ලැබීමට සුදුසුකම් ලබන සියලුම සිසුන්ට ශිෂ්‍යත්ව පිරිනැමීමට හැකි ක්‍රමවේදයක් කඩිනමින් සකස් කළ යුතුය.

(ආ) (i) 2013 ජූලි 30 දින සිට ක්‍රියාත්මක කර තිබූ මංගත ලොතරැයිය සඳහා තෝරාගත් ලොතරැයිකරු විසින් එයින් ඉවත්වීම හේතුකොට ගෙන අරමුදලට ලැබිය යුතු රු. මිලියන 750 ක් නොලැබීම සම්බන්ධව අභ්‍යන්තර විමර්ශණයන් සිදුකිරීමට හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කර අදාල නිලධාරීන්ට විරුද්ධව නීත්‍යානුකූල පියවර ගැනීමට 2021 ජනවාරි 08 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී නියෝග කර තිබුණද ඒ සඳහා පියවර ගෙන නොතිබුණි.	මේ සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාවේ විමර්ෂණයෙක් සිදු වේ.	පොදු ව්‍යාපාර කාරක සභාවේ නියෝගය පරිදි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කර අදාළ නිලධාරීන්ට විරුද්ධව නීත්‍යානුකූල පියවර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතුය.
(ii) මාර්ගගත ලොතරැයියක් නැවත ආරම්භ කිරීම සඳහා 2021 ඔක්තෝබර් 18 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු අතර, විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයක් යටතේ තෝරාගත් කොන්ත්‍රාත්කරු වෙත අදාල කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා 2023 පෙබරවාරි මාසයේදී ප්‍රසම්පාදන කමිටු අනුමැතිය සහ භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණ ද, මෙම වාර්තාවේ දිනය වන විටත් මාර්ගගත ලොතරැයිය ක්‍රියාත්මක කර නොතිබුණි.		මාර්ගගත ලොතරැයිය ක්‍රියාත්මක කිරීම කඩිනම් කළ යුතුය.

3.4 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
භාර අරමුදල සඳහා වූ අනුමත කාර්ය මණ්ඩලය අනුව, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුර (අධ්‍යක්ෂ), මධ්‍යම කළමනාකරණ මට්ටමේ තනතුරු 03, ද්විතීය හා තෘතීය මට්ටමේ තනතුරු 14 න් තනතුරු 03 ක් 2025 අප්‍රේල් 30 දින වන විට පුරප්පාඩුව පැවතුනි . මෙසේ සේවක පුරප්පාඩු පැවතීම විශ්වවිද්‍යාල සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවල සිසුන්ට නියමිත දිනට මහපොළ ශිෂ්‍යාධාර ගෙවීම මෙන්ම ආයතනයේ අනෙකුත් කටයුතු කෙරෙහිද අහිතකර ලෙස බලපා තිබුණි.	භාර අරමුදලේ සේවක පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් අනුමැතිය ලැබී ඇති බැවින් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ, මධ්‍යම කළමනාකරණ මට්ටමේ හා ද්විතීක මට්ටමේ තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා ඇති අතර,එම තනතුරු බඳවා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී.	අත්‍යාවශ්‍ය තනතුරුවල පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතුය.